# කවි කොළය



## පොල් පොල් පොපොල්...!

පොල්ගස එදා කප්රුක විය සිහළ රටේ
අද පිට රටින් පොල් ගෙන්වා ඔබති කටේ
ලොකු වතු කැබලි කර විකුණති හැටට හැටේ
ජාතික ධනය දියවී බිංදුවට වැටේ

රජ කාලයෙහි සිට ඉතිහාසයෙහි දුර
මේ දිවයිනේ උරුමය විය. නෙරළු තුර
පොල් පිට රටින් ගෙන්වා කෑ අඳුරු බර
යුගයක් රටේ තිබුණද කිසි දිනක පෙර?

පැතිරී ලෙඩක් අතු වියලෙන නෙරළු තුරේ
කැපුවා ලක්ස ගණනින් ගස් මුහුදු කරේ
නව නීතියක් පණවා මේ අතර තුරේ
පොල්ගස් කපන්නන් අල්ලා දමති හිරේ

"පොල් හිඟ වුණේ ජවිපේ ගස් කැපුව නිසයි"
යන බස අපේ ගරුතර පොල් ඇමති දෙසයි
සමහරු කතරගම ගොස් පොල් පොළවෙ ගසයි
ඒ පොල් කන්ද කිරිවෙහෙරට වැඩිය උසයි

"එක පොල් ගහක්වත් දැක ගන්නට නැත්තේ
රුපියල් තිහට පොල් මැද පෙරදිග ඇත්තේ"
පවසයි කෙනෙක් කොළ අලි කඳවුර පැත්තේ
අප මෙහි පොල් හැටට හැත්තෑවට ගත්තේ

බෑ දෙක වෙනම වෙන්කර පොල් ගෙඩිය බිඳ
කෙරුවා අළෙවි තැන් තැන්වල නගර බද
පොල් ගා පැකට්කර විකුණන තැනට අද
පත්වී තිබේ මේ රට මොන කරුම යද?

පොල් මිළ නගින විට පොල් කෑමෙහි අගුණ
පත්තර වල ලියති කරමින් එය දෙගුණ
පොල් බූරුවෝ පෙර පොල්ගස්වල නැගුණ
පවසති කතා බොරු දෑ හැඟුමෙන් පෙඟුණ

මෙරටේ තිබෙන පොල්ගස් ගණනටද වඩා
මැතිවරු ඇමතිවරු වෙති මේ රටෙහි කුඩා
ඔලුවේ ඔතාගෙන ඉණ ඇඳි සරම කඩා
පොල් පොල් පොපොල් වැල් බයිලා නටති දොඩා

වැළඳුණු ඇතැම් අය
දෙස්පාලනයෙ උණ
පොල්ගස් බිම හෙළති
වැදුණත් රටට හෙණ
ගරුතර ඇමතිවරයා
කී රටට බණ
ලෝකය වටේ යනවා
පොල්කටුව ගෙන



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

# අම්මා



**රත්නා පුෂ්ප කුමාරි විසිනි**

මවකගේ ආදරය ලද්දෝ භාග්‍යවන්තයෝ වෙති. මව්කිරි දීමෙන් ලෝකයේ ප්‍රථම ස්ථානය ශ්‍රීලංකාවට හිමිවීම පිළිබඳව පසුගිය සතිවල අපි අභිමානයෙන් කතාකළෙමු. එහෙත් ඒ මව්කිරි බී හැදුණු සමහර දූ දරුවන් තම මවට ඊට ප්‍රති උපකාර දක්වන්නේ ඉතා පහත් ආකාරයෙන් බැව් පෙනෙන ප්‍රවෘත්ති දිනපතා පුවත්පත් හා විවිධ මාධ්‍යන් මගින් අපට පෙනේ.

බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ ගෙට
මැනලා වී ටිකක් දුන්නයි මල්ල කට
ගන්දෝ නොගන්දෝ කියලා සිතුණි මට
මැනලද පුතේ කිරි දුන්නේ මා නුඹට

මේ කවිය කුඩා කල සිට අසා නැති කෙනෙක් නැති තරම්ය. මේ කව කියවන ඕනෑම සංවේදී කෙනෙකුගේ නෙතට කඳුළක් නැගේ. මෙලොව ඇති වඩාම වටිනාම හැඟීම මවකගේ ආදරය සේම එය අමිල හා වෙනස් නොවන බැඳීමකි.

සාමාන්‍යයෙන් දියණියකට නම් අප කියන්නේ මවකගේ අගය දැනෙන්නේ ඇයද මවක් වූ පසුව බවයි. එහෙත් මේ අගය දැනෙන්නට එතරම් පමා නොවිය යුත්තේ එය පසුතැවිල්ලට කාරණයක් වන නිසාවෙනි. ජීවිතයේ සෑම අවස්ථාවකම මවට විශේෂ ස්ථානයක් ලබාදෙන දරුවෝ ආශීර්වාද ලද්දෝ වෙති.

නිවෙස්වල පැවැත්වෙන බොහෝ දරුවන්ගේ උපන්දින සාදවල මව සිටින්නේ කුස්සියේය. සියළු ආවතේව මව සිදුකරන විට දරුවෝ සාලයේ සිට සාදයේ සතුට භුක්තිවිඳිති. මව එහි සතුට නෙතේ රැඳුණ කඳුළකින් පිටකර ගනියි. සෑම දරුවෙක්ම තම උපන්දිනය දා ශුභ පැතිය යුත්තේ තම මවටය. "අද වගේ දවසක මාව බිහිකළාට අම්මට පිං......" යනුවෙන් ඔබ පැවසුවහොත් ඔබේ මවගේ සිතේ උතුරන ආදරය ඔබේ ජීවිතයට තව තවත් භාග්‍යය උදාකර දෙනු ඇත.

අපගේ ජනජීවිතයේ සේම සම්ප්‍රදායික චාරිත්‍රවලදීද මවට ලබාදී ඇති ගෞරවය අපමණය. දියණියක් විවාහ පත්වන විට පෝරුව චාරිත්‍ර වාරිත්‍රවලදී සාම්ප්‍රදායිකව සිදුවන මෙහෙයයන් ඉතා හැඟීම්බරය. මවගෙන් බිව් කිරි, රෙදි කච්චියක පෙහෙව්වද එය ප්‍රමාණවත් නොවන බැව් සනාථකරන්නට මවගේ හිස මතට ලබා දෙන රෙදි කච්චිය සැමට හැඟීම්බර දසුනක් මවයි.

සෑම මවක්ම තම දියණිය මවක් වන දිනය දෙස බලන්නේ චකිතයකිනි. මේ අවස්ථාවට තම දියණිය කෙසේ මුහුණ දේ දෝයි සෑම මවක්ම බිය වෙති. සෑම මවකටම මෙලොවින් යාමට ඇති එකම බාධකය තම දරුවන් ය. ලොවම අත්හැරිය ද තම කුසෙන් බිහිකළ දරුවන් අත්හරින්නට මවකට අසීරු ය.

මහළු වයසට එත්ම යළිත් වැඩිහිටියෝ කුඩා දරුවෝ මෙන් වෙති. කුඩාදරුවන්ට මෙන් ඔවුනටද ආදරය, අවධානය, අගය කිරීම අවශ්‍ය බැව් තේරුම් නොගන්නේ නම් එය අභාග්‍යයකි.

එකම පවුලක විසුවත් නැතත්, කොපමණ රාජකාරි බහුල වුනත්, දරුවෙකුගෙන් ඇමතීමක් එනතුරු දෙමාපියෝ බලා සිටිති. ඔවුන්ට එය මහමෙරක් බඳුය.

ලොව වඩාත් අසරණ වන්නිය මවක් යයි මට සිතේ. දරුවන් ඉදිරියේ ඇය නිරන්තරව අසරණ වන්නීය. දරුවෙකු බිහිවූ දින ඇගේ සියළු වේදනාවන් විඳගනිමින් දරුවගේ මුහුණ දැක සතුටුවන්නී ඇය ය. කිසිදු පිළිකුලකින් තොරව දරුවාගේ කැතකුණු අතගාන්නී ඇය ය. දරුවගේ නින්දේදී නිදිවරා රැය පහන්කරන්නී ඇය ය. තම කුසගින්න අමතක කොට දරුවාගේ කුස පුරවන්නී ඇය ය. ලොවටම එපා වුවද කිසිදු පැකිලීමකින් තොරව තම දරුවා රජෙකු මෙන් පිළිගන්නී ඇය ය. ලොවින් සමුගන්නා මොහොතේ වුව තම වැඩිමහල් දරුවෙකුගේ මුහුණ සිනිඳු ලෙස අතගා ලොවින් සමුගන්නට පෙරුම්පුරන්නී ඇයම ය.

දුක් කම්කටොළු ප්‍රාර්ථනා සිතේ සිරකරගෙන වඩවිදින මවකට ඔබේ සෙනෙහස මහමෙරකට වඩා වටින්නේය. මව දුර බැහැරක ජීවත්වුවද රාත්‍රි නින්දට පෙර විනාඩියකට සුවදුක් විමසීමට ඔබට හැකිනම් එය ඇගේ ජීවිතයේ වටිනාම විනාඩි ගණන වනු ඇත. ඇයට ප්‍රබෝධයෙන් නින්දට යාමට හැකිවනු ඇත.

බොහෝ දූ දරුවෝ දෙමව්පියන්ට සැලකීම අනාගතයට බාර කරති. "හොඳ රස්සාවක් ලැබුණම සලකනවා..... අපේ ප්‍රශ්න විසඳගෙන එපාය අම්මලට සලකන්න...." ඔය ආදී වශයෙන් කල්පනාකොට තමන්ම රවටා ගනිති.

එහෙත් අපට නොපෙනෙන, එහෙත් දැනෙන, මේ විශ්වයේ

9 පිටුව බලන්න →




**ඉරිදා** - දෙසැම්බර් 31 වෙනිදා හවස මමයි, නිහාලුයි, දුවයි,
**SUN** පුතයි වොන්ඩ්ස්වර්ත් ගියා සුධර්මා අක්කලයි දිහා.

එන ගමන් පුතා ඇහුවා ස්ටීවන් කියලා යාළුවෙකුගෙ දිහා හවස යන්නද කියලා. ගියොත් පස්සෙන්දා උදේටයි එන්නෙ කිව්වා. නිහාල් ගත් කටටම කිව්ව එපා කියලා. මම කිව්වා "අපි කවුරුත් හෙට පළවෙනිදා උදෙන්ම අමරාවතී විහාරෙට යනවා, ඒනිසා රෑට එහෙමෙහෙ යන්න එපා" කියලා. ඒ පාර පුතා කියනවා, "අයියෝ අම්මා අමරාවතී මහ බෝරිං ගමනක්" කියලා. නිහාල් බරාස් ගාලා බ්‍රේක්ගැහුවා බැටර්සී පාලම උඩම. පුතාට පහලින් යන ගඟ පෙන්නලා කිව්වා, "අර බලපං තේම්ස් ගඟ. මං දැන් උඹව උස්සලා විසිකරනවා ගඟට, ආයිත් ඔය වගේ කතාවක් කිව්වොත්" කියලා. කොල්ලා බයවුණා. ඒක හරි. ළමයින්ට ඕන විදියට එහෙම හැදෙන්න දෙන්න බෑ.

**සඳුදා** - ලංකාවට කතා කළා අවුරුද්දට සුබ පතන්න. මේ
**MON** සැරේ එහේ හුඟක් ගෙවල් වල කිරිබත් උයලා නෑ පොල් නැති නිසා. කැතරින් පුංචි අම්මා කියනවා පොල් ගෙඩියක් කොළඹ රුපියල් පණහලු. ගාලදෙන්න තව රුපියල් පහක් ගන්නවලු. මම කිව්වා ඒක හොඳ රස්සාවක් කියලා. දවසට පොල්ගෙඩි දාහක් ගාගත්තොත් රුපියල් 5000 ක්. කේරලෙන් ආණ්ඩුව පොල් ගෙන්නනවට පුංචි අම්මා විරුද්ධයි. මොන ලැජ්ජාවක්ද කියලා අහනවා. ඒක ඇත්ත.. කවදාවත් හිතුවද ලංකාව පිටරටින් පොල් ගෙන්නයි කියලා.? ලක්ෂ්මී බායිගේ පැරණි සිංදුව මට මතක් වුණා. "ආදී සිංහලුන් පිට දීප දේස ජයගත්තා.... අද කන්ට අදින්ටා.... පිටරටින් එනතුරු.... මුහුදට දත නියවන්නා...." ඇත්තට අනේ මේ වෙන්නෙ ඒක නේද?

**කුජදා** - මේ ටිකේම ලංකාවෙන් එන නිව්ස් සේරම කේර
**TUE** ළෙන් ගේන පොල් ගැනයි, ඉන්දියාවෙන් ගෙන්වන බිත්තර ගැනයි. ඉන්දියාවෙන් එන හැම බිත්තරේකම ඒ බිත්තරේ දාපු කිකිළිගෙ නමයි, දාපු දවසයි, ඒ පළාතෙ නමයි, හින්දියෙන් ගහලා තියනවයි කියලා සෝමතුංග බාප්ප අද කිව්වා. ඒක කිකිළිම කරන වැඩක්ලු. බාප්ප කියන්නේ ඉන්දියාව ඔය ලංකාව වගේ ආවට ගියාට වැඩක් කරන්නෙ නැත, කුකුළෙක් හැදුවත් නියම විදියට හදනවය, ඒකෙන් පේනවයි ඉන්දියාවෙ කිකිළියො වුනත් අකුරු සාස්තරේ දන්න උගත් සත්තුය කියලා.

**බුදදා** - ඉන්දියාවෙන් ගේන බිත්තරයි පොලුයි විකුණන
**WED** කඩවත හන්දියෙ කඩේකට ගියාම එතන මුදලාලි එතනට බඩු ගන්න එන අයත් එක්ක කතා කරන්නෙ හින්දි බාසාවෙන්ලු. මුදලාලිගෙ හාමිනෙයි දරුවොයි සේරම කතා කරන්නෙ එහෙමලු. ඒ ඉන්දියන් බිත්තර කෑමෙන් වෙච්ච දෙයක්ලු. සීලවති නැන්දා බිත්තරත් අරගෙන "එහෙනම් මුදලාලි අපි ගිහිං එන්නම්" කිව්වම මුදලාලිගෙ දුව කිව්වලු "ජබ් පයාර් කිසීසේ හෝතා හේ" කියලා. නැන්ද කියනවා ඒ කියන්න ඇත්තෙ "හා හොඳයි ගිහිල්ලා එන්න" කියලා වෙන්න ඇතිලු. නිකම්ම හින්දි බාසාව ඇඟ ඇතුළටම වදින හන්ද ලංකාවෙ අද හැමෝම ඉන්දියන් බිත්තරමලු ඉල්ලන්නෙ.

**ගුරුදා** - මං වෙබ් එකේ ලංකාවෙ පත්තර කියවන කොට
**THU** දැක්කා මහාචාර්යවරයෙක් ලියලා තිබුණා පොල් වල අගුණ. පොල් අන්තිම නරක දෙයක් හැටියටයි පෙන්නලා තිබුණේ. කොලොස්ටරෝල්, හෘදයාබාධ, බඩවැලේ ප්‍රශ්න, වාත අමාරු, ආතරයිටිස් ඔය ආදී සියයකට වඩා රෝග වලට හේතුව ලංකාවෙ මිනිස්සු කෑමවලට පොල් පාවිච්චි කරන නිසාය කියලා උන්නැහේ කියනවා. ඒ නිසා මේ දැන් තියන පොල් හිඟවීම රටේ යහපතට වුනු දෙයක් හැටියට සලකන්නලු. කවුද කියලා තිබුණා මැන් මේ ආණ්ඩුවට ජැක්එකක් ගහනවයි කියලා. මම නම් එහෙම හිතන්නෙ නැහැ. අනෙක එයා මහාචාර්ය කෙනෙක් නේ. ඒ නිසා ඒ කියන දේ පිළිගන්න එපායැ. හැබැයි ළඟදි එයාට කොහේදෝ රටක ඇම්බැසිඩර්කමක් හම්බ වෙන්න යන කතාවත් ආරංචියි. එහෙනම් අපිට පුළුවන් දෙවරක් දෙක හතරයි කියලා හිතෙන් ගණන හදාගන්න.

**කිවිදා** - යුද අපරාධ කළාය කියලා ලංකාව යුධ අධිකර-
**FRI** ණයකට ගෙනියන්න වලිකාපු එක්සත් ජාතීන්ගෙ ලොක්කා බැන්කි මූන්ට ලංකාවෙ පස් පාගන්න දෙන්නෙ නැත කියපු රාජපක්ෂ රජය අන්න මැන්ස්ලට එන්න දීලා. හුඟ දෙනෙක් හිතන්නෙ ලංකාව ඉල්ලන් කන්න හදනවයි කියලා. වෙන්න පුළුවන්. තවම කොටින්ගෙ බලපෑම ඉවර නැහැ. නෝර්වේ ඇමරිකාව ඇතුළු බටහිර රටවල් පෙන්නුවෙ නැතුවට ලංකාවත් එක්ක මාර තරහෙන් ඉන්නෙ. ලංකාව ලෝකෙ ලොකුම ත්‍රස්ත යුද්දෙ දිනපු වෙලාවෙ මුන් එකෙක්වත් විසිල් එකක්, අත්පුඩියක් ගහපු එවුන් නෙවෙයි. බැන්කියා එන්නෙ හොඳකට නෙවෙයි කියලයි මටත් හිතෙන්නෙ. කොහොම හරි අපිව දැලට දාගන්නයි උන්ට ඕන. මේ වැඩේ අපිට හොඳට හිටින එකක් නැහැ. ලංකාව හොඳ සීයක් කරලා එක මහා ගොන්කමක් කරනවා අර සේරම කැන්සල් වෙලා යන. ඒක එදා ඉඳලම ලංකාවෙ හැටි. සිංහලයයි කැවුම් අතරයි තියන සම්බන්ධෙ වෙනස් නොවී හැමදාටම පවතිනවා.